# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 7 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 මාර්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2026 මාර්තු මස 06 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 20.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2026 අංක 7 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2026 මාර්තු මස 06 වන දින]

එල්.ඩී. - ඕ 39/2024

### (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2026 අංක 7 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

218 වන අධිකාරයට 54අඅ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

2. (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 54අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 54අඅ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“මහ මුහුදේ දී අන්තරායදායක ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ජාවාරම් කිරීම තහනම් කිරීම.

**54අඅ.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ නොවන යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැවක හෝ අදේශික නැවක සිටින අතුරතුර, මහ මුහුදේ දී, මතු දැක්වෙන අන්තරායදායක ඖෂධ වර්ගවලින් යමක්, එනම් හෙරොයින්, කොකේන්, මෝෆීන් හෝ අබිං නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට මරණීය දණ්ඩන නියමයට හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයට යටත් විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ නොවන යම් තැනැත්තකු විසින්-

(අ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැවක හෝ අදේශික නැවක සිටින අතරතුර, මහ මුහුදේ දී; සහ

(ආ) මේ පරිච්ඡේදයේ විධිවිධානවලින් අවසර දී ඇති පරිදි හෝ එකී විධිවිධානවලට අනුකූල වන ආකාරයකින් හැර, නැතහොත් අධ්‍යක්ෂවරයාගේ බලපත්‍රයකින් අවසර දී ඇති පරිදි හෝ එවැනි බලපත්‍රයකට අනුකූල වන ආකාරයකින් හැර,

තුන්වන උපලේඛනයේ III වන කොටසේ දක්වා ඇති යම් අන්තරායදායක ඖෂධ වර්ගයක්, එකී උපලේඛනයේ III වන කොටසේ II වන තීරයේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවා සන්තකයේ තබා ගනු ලබන හෝ ජාවාරම් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, එකී උපලේඛනයේ III වන කොටසේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද වරදක් සිදු කිරීමේ දී යොදා ගන්නා ලද යම් අදේශික නැවක්, රාජ්‍ය සන්තක කිරීමට යටත් විය යුතු අතර, 79 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නැව සම්බන්ධයෙන් අදාළ කර ගත යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා -

“මහ මුහුද” යන්නෙන්, ජාත්‍යන්තර නීතිය යටතේ වූ අනන්‍ය ආර්ථික කලාපයේ නෛතික තත්ත්වයට අගතියකින් තොරව, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රාජ්‍යයක දේශීය ජල තීරයෙන් ඔබ්බට වූ සියලු ජල තීර අදහස් වේ;.

"නිෂ්පාදනය කිරීම" යන්නට, 54අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඒ සඳහා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අදේශික නැව" යන්නෙන්, යම් රාජ්‍යක නීති යටතේ ලියාපදිංචි කර නොමැති හෝ ධජයක් නොදරන යම් යාත්‍රාවක් අදහස් වේ;

"ජාවාරම් කිරීම" යන්නට, 54අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඒ සඳහා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54ආ වන වගන්තියේ "54අ වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "54අ වන සහ 54අඅ වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54ආ වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "54අ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු වූ තැනැත්තකු හැර," යන වචන සහ ඉලක්කම් වෙනුවට, "54අ වන සහ 54අඅ වන වගන්ති යටතේ වූ වරදකට වරදකරු වූ තැනැත්තකු හැර," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "54අ වන සහ 54ආ වන වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "54අ වන, 54අඅ වන සහ 54ආ වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ “54අ වගන්තියේ (1) වන උපවගන්තිය සහ 54ආ වගන්තිය” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය, 54අඅ වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති සහ 54ආ වන වගන්තිය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පැති සටහනේ “54අ වන සහ 54ආ වන වගන්ති” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “54අ වන, 54අඅ වන සහ 54ආ වන වගන්ති” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ “54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 54ආ වන වගන්තියේ” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 54අඅ වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සහ 54ආ වන වගන්තියේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ “54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 54ආ වන වගන්තියේ” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 54අඅ වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සහ 54ආ වන වගන්තියේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “54 වන වගන්තිය හෝ 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) හෝ (ඈ) ඡේද” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “54 වන වගන්තිය, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) හෝ (ඈ) ඡේද හෝ 54අඅ වන වගන්තියේ (2) වන උපවගන්තිය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "54 වන වගන්තිය හෝ 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "54 වන වගන්තිය, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 54අඅ වන වගන්තියේ (2) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ "52 වන වගන්තිය, 54 වන වගන්තිය, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද සහ 54ආ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "52 වන වගන්තිය, 54 වන වගන්තිය, 54අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද, 54අඅ වන වගන්තියේ (2) වන උපවගන්තිය සහ 54ආ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි ''ප්‍රකාශන පියස'' හි දී මිල දී ගත හැක.